www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුරෝපීය සංගමය ඕස්ට්‍රේලියාව හා කැනඩාව ඉරානයට දැඩි සම්බාධක පනවයි

## EU, Australia and Canada impose tough sanctions on Iran

**පීටර් සිමන්ඩ්ස් විසිනි**

**2010 ජූලි 30**

ඉරානයට එරෙහි වොෂින්ටනයේ උත්සන්න කල ව්‍යාපාරයේ කොටසක් ලෙස යුරෝපීය සංගමය (ඊයූ) කැනඩාව හා ඕස්ට්‍රේලියාව ටෙහෙරානයේ න්‍යෂ්ටික වැඩසටහනට එරෙහිව මෙම සතියේ ප්‍රබල නව සම්බාධක පැනවීය. ඉරානයට බලකිරීමේ මාධ්‍යයන් ලෙස හුවා දක්වනු ලැබුව ද සම්බාධක වනාහි යුද්ධය සඳහා වේදිකාව සකසන අනතුරුදායක ගැටුමක තවදුර පැතිරයාමක් වෙයි.

ඒකපාර්ශවීය ස්වභාවයක් ගන්නා නිවේදනය කල සියලු සම්බාධක පසුගිය මාසයේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය එකඟවූ දඬුවම් පැනවීමට වඩා බොහෝ දුර යන ඒවාය. ඉරානය තමන් න්‍යෂ්ටික අවි නිපදවීමට සැලසුම් කරන බවට එල්ල කෙරෙන චෝදනා යලි යලිත් ප්‍රතික්ෂේප කර තිබෙන අතර යුරේනියම් සුපෝෂනය ද ඇතුලු න්‍යෂ්ටික ඉන්ධන චක්‍රයේ සියලු කාරනා වලට සම්බන්ධ යයි සහතික කෙරෙන න්‍යෂ්ටික අවි හරන ගිවිසුම යටතේ තමන්ට හිමි අයිතීන් උල්ලංඝනය කිරීමක් වන බව පවසා සියලු සම්බාධක ප්‍රතික්ෂේප කලේය.

පසුගිය 26 දින යුරෝපීය සංගමය එහි විදේශ ඇමතිවරුන්ගේ රැස්වීමෙන් පසුව සම්බාධක නිවේදනය කලේය. යුරෝපීය සංගමයේ විදේශ ප්‍රතිපත්ති පිලිබඳ ප්‍රධානී කැතරින් ඇෂ්ටන් මාධ්‍ය වෙත ප්‍රකාශ කලේ "අප ඉරානය වෙත බලගතු පනිවිඩයක් යවා ඇත්තෙමු. එය වනාහි ඔවුන්ගේ න්‍යෂ්ටික වැඩ සටහන අපගේ වැඩෙන හා බලගතු කනස්සල්ට හේතුවී තිබෙන බවයි." මෙම පියවර මගින් යුරෝපීය සමාගම් ඉරානයේ තෙල් හා ගෑස් ක්ෂේත්‍රයේ කරන ආයෝජන තහනම් කිරීම මෙන්ම වෙලඳ හා මූල්‍ය සම්බන්ධකම් ද සීමාකර තිබීම කැපී පෙනෙයි.

විදේශ ඇමතිවරු 27 දෙනා යට සඳහන් එකඟතාවයට පැමිනි බව යුරෝපීය සංගමයේ නිවේදනයෙන් ප්‍රකාශ කෙරෙයි. "වෙලඳ මූල්‍ය සේවා බලශක්ති ප්‍රවාහන මෙන්ම වීසා බලපත්‍ර හා වත්කම් තහනම සඳහා අමතර රෙගුලාසි පැනවීම යන කරුනු පිලිබඳව පුලුල් හා දැඩි පියවර ගැනීම" සඳහා එකඟත්වයක් ඇතිකරගෙන තිබෙන බවයි. විස්තර තවමත් ප්‍රකාශයට පත්කර නැති අතර සම්බාධක ඉරානයේ බැංකු, ඉස්ලාමීය රැකවල් සේනාංක හා ඉස්ලාමීය ඉරාන සමූහාන්ඩුවේ නාවික මාර්ග ඉලක්ක කරගනු ඇත.

කැනඩාව ද ඒ හා සමාන සම්බාධක 26 දින නිවේදනය කලේය. එයට ඉරානයේ බලශක්ති ක්ෂේත්‍රයේ කුමන හෝ නව ආයෝජන තහනම් කිරීම බැංකු සම්බන්ධකම් සීමා කිරීම හා න්‍යෂ්ටික වැඩසටහන් සඳහා යොදාගතහැකි භාන්ඩ අලෙවිය තහනම් කිරීම ඇතුලත් වේ. පෙර දිනයේ ඕස්ට්‍රේලියාව ද එම මග ගනිමින් ඉරානයේ බැංකු හා ප්‍රවාහන ක්ෂේත්‍රයන්හි 110 වැඩි සමාගම් හා පුද්ගලයින් සංඛ්‍යාවකට සංචාරක හා මූල්‍ය ගනුදෙනු තහනම් කල අතර යුරෝපීය සංගමය හා කැනඩාව මෙන්ම ඉරානයේ තෙල් හා ගෑස් ක්ෂේත්‍රයන්හි ගනුදෙනු සීමා කිරීමට ඉඩ ඇත.

විශේෂයෙන්ම යුරෝපීය සම්බාධක ඉරාන ආර්ථිකය කෙරෙහි වැඩිම හානියක් කිරීමේ ශක්‍යතාව සහිත ය. සමස්තයක් ලෙස ගත්කල යුරෝපීය සංගමය ඉරානයේ විශාලතම වෙලෙඳ ගනුදෙනුකරුවා වෙයි. ඉරානයේ අපනයන වලින් තුනෙන් එකක් යැවෙන්නේ ද එම රටට ඩොලර් බිලියන ගනනක නිෂ්පාදන පැමිනෙන්නේ ද යුරෝපීය සංගමයෙනි. එක් යුරෝපීය සංගමයේ තානාපති වරයෙක් *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතට පැවසුවේ මෙසේය: "සම්බාධක ඉතා සියුම් ලෙස ඉලක්ක කර තිබේ. රක්ෂන බැංකු හෝ නවීන බලශක්ති තාක්ෂනය වැනි මෙම සේවාවන්ගෙන් බොහොමයක් අනෙකුත් වෙලඳ ගනුදෙනුකරුවන්ගෙන් ලබාගත නොහැකිය."

ඉරානයේ බලශක්ති ක්ෂේත්‍රය තුල යුරෝපීය සමාගම්වල කටයුතු තහනම් කිරීම, යටිතල පහසුකම්වල උග්‍ර හිගය තවත් පුලුල් කරනු ඇත. එරටෙහි දැවැන්ත තෙල් හා ගෑස් නිධි පැවතිය ද ආයෝජනයේ හීනතාවය

බරපතල ගැටලු මතුකර තිබේ. පිරිපහදු කිරීමේ පරිමානයෙහි ඌනතාවය නිසා ඉරානයට පිරිපහදු කල තෙල් අවශ්‍යතා වලින් සියයට 30-40 අතර ප්‍රමානයක් ආනයනය කිරීමට බලකෙරී තිබේ.

මෙම මස මුලදී එක්සත් ජනපද කොන්ග්‍රසය ඉරනයට එරෙහිව සිය ඒකපාර්ශවීය සම්බාධක පැනවිය. මෙම නීතිවල අරමුන ඉරානයේ තෙල් ආනයනයේ ගෙල සිරකිරීම හා එරට ආර්ථිකය දනගැස්වීමය. නව නීති යටතේ පිරිපහදු කල පෙට්‍රෝලියම් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉරානයට අලෙවි කිරීමේ නිරතවන විදේශ සමාගම් එක්සත් ජනපද මූල්‍ය පද්ධතියෙන් හා වෙලඳපොලෙන් නෙරපා හැරීමකට මුහුනදෙනු ඇත.

එකසත් ජනපද නීති තවදුරටත් ආතතීන් ඇවිලවීමට තර්ජනය කරන්නේ ඉරානය සමග පමනක් නොවේ. එය ඉරානයේ බලශක්ති ක්ෂේත්‍රය සම්බාධක වලට ඇතුලත් නොවිය යුතුය යන පදනම මත එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩල යෝජනාවට පසුගිය මාසයේදී එකඟත්වය පලකල චීනය හා රුසියාව වැනි අනෙකුත් රටවලට ද යෙදෙනු ඇත. චීනය ඉරානයේ ප්‍රධාන තෙල් ගැනුම්කරුවෙක් වන අතර ඉරානයේ ගෑස් බිම්වල ආයෝජන වැඩි කිරීමේ සැලසුම් ද සතුව සිටියි. යුසං අලුත්ම සම්බාධක "පිලිගත නොහැකි හා ප්‍රවේශමෙන් සකස් කරන ලද හා සම්බන්ධීකරනය කල එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩල යෝජනාවේ ප්‍රතිපාදන අවතතක්සේරු කිරීමක්" පෙන්නුම් කරන බව පවසමින් රුසියාව ඒ කෙරෙහි කෝපාවිෂ්ට ප්‍රතිචාරයක් දැක්වීය.

ඔබාමා පාලනාධිකාරය රාජ්‍යතාන්ත්‍රික ප්‍රහාරයක් දියත්කර ඇත්තේ එජා ආරක්ෂක මන්ඩලයේ සම්බාධක රටවල් මත පැටවීමට පමනක් නොව එක්සත් ජනපදයේ හා එහි හවුල්කරුවන්ගේ හිතුවක්කාරී දඬුවම් යලි පනගැන්වීම සඳහා ද වේ එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුවට අනුව එහි න්‍යෂ්ටික අවි සීමාකිරීමේ හා අවි පාලනයේ විශේෂ උපදේශක රොබට් එයින්හෝන් එලඹෙන සතියේදී දකුනු කොරියාව හා ජපානය බලා පිටත්ව යනු ඇත. එක්සත් ජනපද භාන්ඩාගාර නිලධාරී ස්ටුවර්ට් ලිවේ එක්සත් අරාබි එමිරේට්, ලෙබනන් හා බහරේන් කරා ද තවත් ඉහල නිලධාරියෙක් බ්‍රසීලය හා ඉක්වදෝරය බලා ද යනු ඇත.

එක්සත් ජනපදයේ කනස්සල්ල "ඉහලම මට්ටමේදී" පෙන්නුම් කර දීම සඳහා තමන් හා ජ්‍යෙෂ්ඨ භාන්ඩාගාර නිලධාරියෙකු චීනය කරා ගමන්ගනු ඇතැයි එයින්හෝන් නිවේදනය කලේය. "ඔවුන් ආරක්ෂක මන්ඩලයේ යෝජනා හෘද සාක්ෂියට එකඟව ක්‍රියාත්මක කරන බවත් වගකිවයුතු රටවල් ඉරානයෙන් ඈත්වෙමින් තිබෙන අවස්ථාවේ ඔවුන් එම "අඩුව නොපුරවන" බවත් සහතික කරගැනීම අපට අවශ්‍ය වන්නේ" යයි ඔහු පැවසීය. "අඩුව නොපිරවීම" යනුවෙන් එයින්හෝන් අදහස් කරන්නේ චීනය එහි පිරිසිදු කල පෙට්රෝලියම් නිෂ්පාදන ඉරානයට යැවීම වැඩි නොකිරීම හෝ අනෙකුත් රටවල් ඉවත් වෙද්දී බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජන පුලුල් නොකිරීම - එජා ආරක්ෂක මන්ඩලයේදී චීනය එකඟ නොවුන දෙයක් - සඳහා එක්සත් ජනපදය චීනයට බලකරනු ඇති බවයි.

චෝදනා එල්ල කර ඇති න්‍යෂ්ටික අවි නිපදවීමේ සැලසුම් වලට වැඩි අදාලත්වයක් නැති ඉරානයේ තෙල් හා ගෑස් ඉලක්ක කිරීමෙන් එක්සත් ජනපද ව්‍යායාමය පිටුපස ඇති සැබෑ අරමුනු එලිමහනට පැමිනේ. වොෂින්ටනය, ටෙහෙරානයේ න්‍යෂ්ටික වැඩසටහන් ගසාකන්නේ මැදපෙරදිග හා මධ්‍යම ආසියාවේ බලශක්තියෙන් පොහොසත් කලාපයෙහි අධිකාරය සඳහා වන පෘතුල එක්සත් ජනපද අභිලාෂයන් කෙරෙහි වඩාත් සාවධාන වන තන්ත්‍රයක් ටෙහෙරානය තුල යලි පැලපදියම් කරන අතර තුර ඉරානය තුලින් සිය යුරෝපීය හා ආසියානු පිලිමලුන් පිටුදැකීමේ මාධ්‍යයන් ලෙසය.

26 වන දින යුරෝපීය සංගමය සම්බාධක පනවන අතරතුර ඉරානය ජාත්‍යන්තර න්‍යෂ්ටික බලශක්ති ආයතනය (අයිඒඊඒ) වෙත යැවූ ලිපියක් මඟින් ටෙහෙරානයේ සිය පරියේෂන ප්‍රතික්‍රියාකාරකයට අවශ්‍ය ඉන්ධන කූරු සඳහා හීන සුපෝෂන යුරේනියම් හුවමාරු කිරීම මත පසුගිය වසරේ එලඹගත් අඩමාන ගිවිසුම සිලිබඳ සාකච්ඡා යලි ආරම්භ කිරීමට කැමැත්ත ඇඟවුම් කරන ලදී 28 වන දින එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව වොෂින්ටනය අනෙකුත් ප්‍රධාන බලවතුන් සමග එම සාකච්ඡා වලට "මුලුමනින්ම සූදානම්" බව ප්‍රකාශ කලේය. එහිදී ප්‍රතික්‍රියාකාරකය පිලිබඳ යෝජනාව හා ඉරානයේ න්‍යෂ්ටික වැඩසටහන් වඩා පුලුල් ලෙස සාකච්ඡා කෙරෙනු ඇත.

කෙසේ වෙතත් එවන් සාකච්ඡා පැවැත් වුන ද න්‍යෂ්ටික හුවමාරු ගිවිසුම යලි පනගැන්වීම හෝ වත්මන් ගැටුම අවසන් කිරීමේ සාකච්ඡා පිලිබඳව කුමන හෝ බලාපොරොත්තුවක් ඇත්තේ නැත. පසුගිය මාසයේ ආරක්ෂක මන්ඩල ඡන්දයට ක්ෂනික ඉක්බිත්තෙහි බ්‍රසීලය තුර්කිය හා ඉරානය ප්‍රසිද්ධියේ නිවේදනය කලේ හුවමාරු ගිවිසුමේ යලි සැකසූ පිටපතකි. වොෂින්ටනය එය එක එල්ලේම ප්‍රතික්ෂේප කලේය. ඉරානය සමග පූර්වයෙන් පැවති ඒකාබද්ධ සාකච්ඡා වලට එක්සත් ජනපදය සහභාගී වීමේ ප්‍රධාන අරමුන වූයේ බුෂ් පරිපාලනයේ ඒකපාර්ශවික ක්‍රියාමාර්ග මගින් ඈත් කරනලද යුරෝපීය බලවතුන්ගේ සහාය වඩාත් දැඩි පියවර සඳහා ගොනුකර ගැනීමත් චීනය හා රුසියාව විසින් නගන ලද විරෝධතා නිෂ්ක්‍රීය

කිරීමත්ය. එම අරමුනු ඉටුකර ගැනීමෙන් පසුව එක්සත් ජනපදය ඕනෑම අනාගත සාකච්ඡාවක් හුදෙක්ම පාවිච්චි කරනු ඇත්තේ ඉරානයට සිය අවසාන නිවේදන නිකුත්කිරීමේ සංසදයක් ලෙස පමනක් විය හැකිය.

එක්සත් ජාතීන්ගේ නව සම්බාධක පැනවීමෙන් පසුව එක්සත් ජනපද පාලක කවයන්හි සාකච්ඡාවට බඳුන්වන වඩාත්ම කැපී පෙනෙන කාරනය වන්නේ විවෘත සංශයක සන්දර්භය තුල මතුවන ආර්ථික දන්ඩනයන් වොෂින්ටනයේ අරමුනු සාක්ෂාත් කරනු ඇත් ද යන්නයි. මිලිටරි විකල්පය සඳහා නව ජීවයක් ලත් තල්ලුවක් පවතියි. මෙම විවාදය පිලිබිඹු කරමින් බුෂ් යටතේ සේවය කරන ලද හිටපු සීඅයිඒ අධ්‍යක්ෂ මයිකල් හේඩන් ප්‍රකාශ කලේ "මගේ පුද්ගලික අදහස වන්නේ මගේ සැලකිල්ල යොමුවීමට පටන්ගෙන ඇත්තේ (ඉරානයට එරෙහි මිලිටරි ප්‍රහාරයක්) සියලු විකල්ප අතුරින් නරකම එක නොවිය හැකි බවයි."

කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකරමින් හේඩ්න් කියා සිටියේ න්‍යෂ්ටික අවියක් අත්පත්කර ගැනීම දෙසට වන ඉරානයේ තල්ලුව "බුරුලක් නොදැක්විය යුතු බව පෙනෙන" කාරනයක් බවයි. ටෙහෙරානය සැබවින්ම පරමානු බෝම්බයක් නිපදවා ඇතැයි පිලි නොගනිමින් වුවත් ඔහු කියා සිටියේ කෙටි දැනුම් දීමකින් පසුව එසේ කිරීමේ හැකියාව අත්කර ගැනීම "ඔවුන්ට සැබවින්ම අවියක් තිබෙනවා හා සමානව ම" නරක තත්වයක් වනු ඇති බවයි. "අපි මැදිහත් වන්නෙමු; ඔවුන් පෙරට යනු ඇත. අපි සම්බාධක වලට ඡන්දය දෙන්නෙමු; ඔවුන් දිගටම ඉදිරියට යනු ඇත. අපි බාධා කිරීමට උත්සාහ කරන්නෙමු; එහෙත් ඔවුන් ඉදිරියටම යනු ඇතැයි කියමින් ඔහු සම්බාධක හා රාජ්‍ය තාන්ත්‍රික කටයුතු අකර්මන්‍ය" යයි බැහැර කලේය.

ඉරානය හා ඊනියා මැදපෙරදිග සාම ක්‍රියාවලිය ගැන සාකච්ඡා කිරීමට මේ සතියේ වොෂින්ටනයට පැමිනි ඊස්රායල් ආරක්ෂක ඇමති ඒහුඩ් බරාක් විසින් ද එවැනිම මනෝගතීන් ප්‍රදර්ශනය කලේය. පසුගිය සතියේ ඔහු *වොෂින්ටන් පෝස්ට්* පත්‍රයට මෙසේ පැවසීයඃ "දැන් මෙන්ම ඉදිරියටත් (සම්බාධක) ක්‍රියාශීලී වන බවක් මට නොපෙනේ. 'නිශ්චිත අවස්ථාවකදී සම්බාධක ක්‍රියාත්මක නොවනු ඇතැ'යි අපගේ සිහියට නැගෙනු ඇත" යනුවෙන් සඳහන් කරමින් බරාක් පෙන්වා දුන්නේ දැඩි ආක්‍රමනශීලී දඬුවම් පිලිබඳව ජාත්‍යන්තර ඒකමතිකත්වයක් නොමැති බවය. ඊස්රායලය නිරතුරුව පෙන්වාදී ඇත්තේ තමන් ඉරානයට න්‍යෂ්ටික අවි ශක්තිය වර්ධනය කර ගැනීමට ඉඩ නොදෙන බවයි. එමෙන්ම එහි න්‍යෂ්ටික මධ්‍යස්ථාන වලට එරෙහිව මිලිටරි ප්‍රහාර එල්ල කරන බවට ද තර්ජනය කර ඇත.

මූලිකත්වය ගන්නේ එක්සත් ජනපදය ද ඊස්රායලය ද යන්න නොතකා ඉරානයට එරෙහි කුමන හෝ මිලිටරි තර්ජනයක් චීනය හා රුසියාව ද ඇතුලු ප්‍රධාන බලවතුන් ඇඳගන්නා කලාපීය ගැටුමක් ඇවිලයාමේ තර්ජනය මතුකරයි. ඔබාමා පරිපාලනයේ දැඩි සම්බාධක සඳහා වන තල්ලුව අනවරතයෙන් තුඩුදෙනු ඇත්තේ මැදපෙරදිග ඉවක් බවක් නැති නව ඇමරිකානු මිලිටරි මදාවියක් වන ඊලඟ පියවර කරාය.

© www.wsws.org